# බළන්ගොඩ නගර සභාව
## 2020-05-14 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020.05.14**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-04-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් 2020-04-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවේ සංශෝධන කිසිවක් නොතිබුණි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- අද දින මහ සභාව කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රජයේ පවත්නා නීතිරීති හා චක්‍රලේඛ ප්‍රකාරව සමාජ දුරස්ථභාවය තබාගනිමින් රජයට සහය දැක්වීම සිදුකරන බැවින් අද දින මහ සභාව පවත්නවන බැවින් ගරු මන්ත්‍රීතුමන්ලා හා මාධ්‍යවේදීන් සඳහා නියමිත පහසුකම් ලබා දීමට නොහැකි වීම සම්බන්ධයෙන් යම් කිසි අපහසුතාවයකට පත්වන්නේනම් සමාව ඉල්ලා සිටින ලදී.
- පසුගිය මාස දෙකක කාලයක් පුරාවට විසඳී නොමැති මහා කෙටි කාලයකින් විසඳාගත හැකි යැයි සිතිය නොහැකි Covid 19 වසංගත තත්ත්වය නිසා බළන්ගොඩ නගර සභා කාර්ය මණ්ඩලය හා සෞඛ්‍ය අංශය විශාල වෙහෙස මහන්සියක් දරා බළන්ගොඩ නගරය හැකි උපරිමයෙන් ආරක්ෂා කර ගැරනීමට සහය දුන් අතර බළන්ගොඩ නගර සභාවේ සභාපති ලෙස තම ස්තුතිය පුද කර සිටින ලදී.

**02. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- ගෝලීය වසංගතයක් වන Covid 19 වසංගත තත්ත්වය නිසා බස්නැවතුම්ලපල ව්‍යාපාරික ස්ථාන (සිල්ලර වෙළෙඳසැල් හා ෆාමසි හැර) 2020.03.18 දින සිට වසා දැමීමට සිදු වූ බැවින් 2020 මාර්තු මස සිට ව්‍යාපාර වසා ඇති කාල සීමාවන්ට අයත් මාස වලට අදාළ කඩ කුළිය නැවත අයකිරීමකින් තොරව කපා හැරීමට කටයුතු කරන ලෙස බස්නැවතුම්පල සරණ ව්‍යාපාරික පදනම විසින් එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යපරික ස්ථාන වසා දමුණු බැවින් කඩ කාමර විවෘත කරන තෙක් කඩ කුලිය අය කර නොගන්නා ලෙස පවසා සිටින ලදී.

- රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020-03-13 දින සිට නිසියාකාරව බස් රථ ධාවනය නොවූ බැවින් බස්රථ ධාවනය නිසියාකාරව යථා තත්ත්වයට පත්වන තෙක් පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමෙන් නිදහස් කරන ලෙස එම්.උදය ශාන්ත මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා රජය මඟින් පනවා ඇති ඇඳිරි නීති රෙගුලාසි අනුව බළන්ගොඩ තානායම වසා වසා දමුණු බැවින් බළන්ගොඩ නගර සභාව සමඟ ඇති කර ගත් කල් බදු ගිවිසුම ප්‍රකාරව මාසික කුළිය වශයෙන් රු.252,000.00 ක මුදලක් නගර සභාවට ගෙවන බැවින් රජයෙන් ලබාදී ඇති සහනය අනුව බළන්ගොඩ තානායම සඳහා මාසිකව ගෙවනු ලබන කුලිය රටේ තත්ත්වය සාමාන්‍ය අතට පත්වී ව්‍යාපාර දිගටම කරගෙන යාමට සුදුසු වාතාවරණයක් ඇතිවන තුරු කුලී සහනයක් ලබා දෙන ලෙස ඉන්දික එරික් සිසිල් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත ලදී.
- කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය හා අංක 16 දරණ එලු මස් කඩ කාමරය 2020-03-20 වන දින සිට ඇඳිරි නීති කාලසීමව තුළ වසා දැමීමට සිදු වූ බැවින් එම කාල සීමාව සඳහා සහනයක් ලබා දෙන ලෙස එන්.එන්.එම්.රිෂ්මි මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- පවත්නා වසංගත තත්ත්වය හේතුවෙන් පොදු වෙළෙඳසැල් අංක 15 දරණ එළ හරක් මස් කඩ කාමරය 2020-03-20 වන දිය සිට වසා දමුණු බැවින් එ සඳහා සහනයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.
- ගෝලීය වසංගතයක් වන Covid 19 වසංගත තත්ත්වය නිසා පොදුවෙළඳසැල ව්‍යාපාරික ස්ථාන (සිල්ලර වෙළෙඳසැල් හා ෆාමසි හැර) 2020.03.18 දින සිට වසා දැමීමට සිදු වූ බැවින් 2020 මාර්තු මස සිට ව්‍යාපාර වසා ඇති කාල සීමාවන්ට අයත් මාස වලට අදාළ කඩ කුළිය නැවත අයකිරීමකින් තොරව කපා හැරීමට කටයුතු කරන ලෙස අංක 07 පොදුවෙළෙඳසැල උෂා ප්‍රදර්ශනාගාරය ආර්.ජී.බී.එස් ගුණසේකර මහතා විසින් එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- ගෝලීය වසංගතයක් වන Covid 19 වසංගත තත්ත්වය නිසා මැණික් කඩ ව්‍යාපාරික ස්ථාන (සිල්ලර වෙළෙඳසැල් හා ෆාමසි හැර) 2020.03.18 දින සිට වසා දැමීමට සිදු වූ බැවින් 2020 මාර්තු මස සිට ව්‍යාපාර වසා ඇති කාල සීමාවන්ට අයත් මාස වලට අදාළ කඩ කුළිය නැවත අයකිරීමකින් තොරව කපා හැරීමට කටයුතු කරන ලෙස මැණික් කඩ අංක 01 නිඩ් වාර්කට් බිල්ඩින්හි ආර්.ජී.බී.එස් ගුණසේකර මහතා විසින් එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- මේ වන විට රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මාර්තු අප්‍රේල් හා මැයි යන මායවල රථ වාහන ටෙන්ඩර් ගාස්තු අයකර ගැනීම සඳහා සහනදායි වැඩපිළිවෙළක් සකසා දෙන ලෙස ටී.ඒ.චමීර මලිත් නිශාන්ත මහතා විසින් එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

04. කල්දී ඇති ප්‍රශ්න

**04.01 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

04.01.01 කොවිඩ් 19 වසංගතය ව්‍යාප්තිය සමඟ අප නගර සභාවට දැනට නොලැබුණු හා අහිමි වූ ආදායම් ගණනය කිරීමක් කර ඇත්ද? එය කොපමණද? (දළ වශයෙන්)

04.01.02 කොවිඩ් 19 හා සම්බන්ධ විෂබීජහරණය හෝ වෙනත් විශේෂ කටයුතු සඳහා අතිරේක හෝ වෙනත් වියදම් දරා ඇත්ද එය කොපමණද? (දළ වශයෙන්)

කොවිඩ් 19 තත්ත්වය සඳහා දරූ වියදම් ශාරාංශය 2020-03-19 දින සිට 2020-05-11

- පවර් ස්ප්‍රේ යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා - රු.16,500.00
- විෂබීජහරණ සම්පූර්ණ ඇඳුම් කට්ටල 12 ක් හා
  සර්විකල් ග්ලවුස් මිළදී ගැනීම - රු.91,690.00
  - විෂබීජහරණ සම්පූර්ණ ඇඳුම් කට්ටල 12 -85140.00
  - ග්ලවුස් ( s 100ක් ) -2150.00
  - ග්ලවුස් ( m 100ක් ) -2250.00
- ණගරය තුළ හා ආයතන පරිශ්‍රයන් ආශ්‍රිතව අත සේදීම සඳහා සින්ක් 05 ක් හා සවිකිරීම සඳහා උපාංග මිළදී ගැනීම 31267.00
- විෂබීජහරණ කුටිය සැකසීම සඳහා මිළදී ගැනීම් - රු.13275.00
- ලීටර් 500 ටැංකියක් මිළදී ගැනීම - රු.5500.00
- සෞඛ්‍ය කම්කරුවන් සඳහා බූට්ස් ජෝඩු 05ක් මිළදී ගැනීම -රු.12995.00
- සෝඩියම් හයිපෝක්ලෝරයිඩ් ලීටර් 500 ක් මිළදී ගැනීම -රු.31320.00
- ක්ලෝරීන් කිලෝග්රෑම් 250 ක් මිළදී ගැනීම -රු.40786.00
- ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි කොවිඩ් 19 වසංගත තත්ත්වය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීඹ සඳහා ප්‍රචාරණ කටයුතු - රු.73500.00

මුලු වියදම - රු.316833.00

රු.100000.00 ක මුදලක් සබරගමුව පළාත් සභාවෙන් ලැබුණු බව පවසන ලදී.

03. කල් දී ඇති යෝජනා

**05:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

05.01.01 කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉරිදා පොළ භූමියෙහි ආහාර අලෙවිය තහනම් කර ඇති බැවින් 2020 මාර්තු මස සිට මහජන පොළ ආපන ශාලාව සඳහා මාසික කුළිය අය කර නොගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා පවසා සිටියේ ආහාර අලෙවි කිරීම සඳහා නොව වෙළෙන්ඳන් සඳහා ආහාර ගෙනවිත් කෑම සඳහා කැන්ටිම විවෘත කරන ලෙස පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.02 බළන්ගොඩ මහජන පොළෙහි විදුලි බිල්පත ගෙවීම සඳහා සහනයක් ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ බළන්ගොඩ නමජන පොළෙහි විදුලි බිල්පත ගෙවීමේදී මහජන පොළ ආපන ශාලාව පවත්වාගෙන යන එම්.ජී.ගුණදාස ය නඅය විසින් මාසික විදුලි බිලෙන් රු.1000.00 ක මුදලක් ගෙවන අතර මාර්තු මස සිට මහජන පොළ ආපන ශාලාව විවෘත නොකළ බැවින් එම මුදල නොගෙවා සිටීම සඳහා සහනයක් ලබා දෙන ඉල්ලීමක් කර ඇති බව පවසා සිටින ලදී.

අනතුරු ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් රු.1000.00 මුදල නොගෙවා සිටීම සඳහා සහනයක් ලබා දදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.03 ZA 5039 JCB යන්ත්‍රය 2020/2021 වර්ෂ සඳහා රක්ෂණාවරණය කිරීම සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල රු.73,194.24 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.04 56-1906 කෘෘ කැබ් රථයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම (බ්‍රේක් සිලින්ඩර් අලුත්වැඩියාව) සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.05 227-5020 ගලි බවුසරය අලුත්වැඩියා කිරීම නව ගලි ටැංකිය සවිකිරීම කම්ප්‍රෙෂර් එකේ බ්‍රැකට් එක වෙනස් කර සවි කිරීමට, එහි බට වෙනස් කර සවි කිරීම හුලං අඳින ෆිල්ටර් මූඩිය අලුතින් දැමීම, බලුගාඩ් දෙක අලුතින් සාදා සවි කිරීම හා අවශ්‍ය ඔයිල් දැමීම යන අලුත්වැඩියා සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.58,100.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.06 ZA 5039 JCB යන්ත්‍රයේ දකුණු පස රෑකින් එක අලුතින් දමා අලුත්වැඩියා කිරීමට තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.14,950.00 ක මිළ ගණන් අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.07 LL 7688 FOTON එකෙහි දකුණු පස හබ් ඇක්සල් එක අලුතින් දැමීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.28,950.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.08 227-5020 ගලි බවුසරයේ මොටර් ෆෑන් එක අලුතින් දැමීම ක්ලච් එක ජෙල් දමා අලුත්වැඩියා කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.13,000.00 ක මිළ ගණන් අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.09 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ණ අනුමැතිය ලබා ගැනීම

- RE 2600 ට්‍රැක්ටරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ස්ටේෂන් සඳහා රු.19,390.00 ක මුදලක් ගෙවීම.

- ZA 5039 JCB යන්ත්‍රය ග්‍රීස් ගසා අර්ධ සේවා කිරීම වෙනුවෙන් ගෙවීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.10,950.00 ක මුදලක් ගෙවීම.
- වෙසක් උළෙල නිමිත්තෙන් නගරය ආලෝක කිරීම සඳහා ටී.ටී.වයර් රෝල් 07 ක් මිළදී ගැනීමවෙනුවෙන් බළන්ගොඩ ඉලෙක්ට්‍රිකල්ස් වෙත රු.15,050.00 ක මුදලක් ගෙවීම.
- නගරය විෂබීජහරණය කිරීම සඳහා පවර් ස්ප්‍රේ යන්ත්‍රයක් මිළදී ගැනීම වෙනුවෙන් ඉසුරු කෘෂි සේවා ආයතනය සඳහා රු.16,500.00 ක මුදලක් ගෙවීම.
- විෂබීජහරණ ඇඳුම් කට්ටල (සම්පූර්ණ කට්ටලටය) හා සර්විකල් ග්ලවුස් මිළදී ගැනීම වෙනුවෙන් රු.91,690.00 ක මුදලක් නිර්මා ෆාමසි වෙත ගෙවීම.
- ගෙවතු වගා සඳහා පොහොර ඇසුරුම් කිරීමට පොහොර කවර මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.16,614.00 ක මුදලක් ගෙවීම.
- නගරය තුළ හා ආයතන පරිශ්‍රයන් තුළ අත සේදීම සඳහා සින්ක් 05ක් සවිකිරීම සඳහා උපකරණ හා උපාංග මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.31,267.00 ක මුදලක් ගෙවීම.
- විෂබීජහරණ කුටිය සැකසීම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත 13,275.00 ක මුදලක් ගෙවීම.
- බැංකියවත්ත සඳහා මාස්ක් හා හෙවි ග්ලවුස් මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.16,320.00 මුදලක් ගෙවීම.
- ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි නගරය තුළ කොවිඩ් 19 තත්ත්වය ප්‍රචාරණ කටයුතු සඳහා දින 11ක් සඳහා දෙවන අදියර ලෙස නාලක ජගත් හෙට්ටිආරච්චි මහතා වෙත රු.38,500.00 ක මුදලක් ගෙවීම.
- විෂබීජහරණ කුටි නිර්මාණය කිරීම වෙනුවෙන් Kavish Mouldin Works ආයතනය වෙත රු.38,000.00 ක මුදලක් ගෙවීම.
- 2020-04-01 දින සිට 2020-04-30 දක්වා ඉන්ධන බිල් පියවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් විෂබීජහරණ කුටිය සම්බන්ධ ප්‍රගතිය කුමක්දැයි විමසන ලදී.නවෝත්පාදන යටතේ මෙම උපකරණය හඳුන්වා දීම වැදගත් වන නමුත් මෙමගින් නිකුත්වන විෂබීජහරණ දියරය සමට අහිතකර බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ඉරියේදී මෙය සෞඛ්‍ය උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.10 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020.04.21 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය ක්ලෝරීන් 250Kg මිළදී ගැනීම | 17 | 011829 | 40,786.04 |
| 2020.04.22 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය - 2020 පෙබරවාරි මස පොදුවෙළෙඳසැල හා මහජන පොළ ජල බිල්පත් ගෙවීම. | 19 | 011831 | 33,801.45 |
| | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය - 2020 පෙබරවාරි මස බස්නැවතුම්පල ජල බිල් ගෙවීම | 20 | 011831 | 74,257.10 |
| | ලංකා විදුලිබල මණ්ඩලය - 2020 පෙබරවාරි මස බස්නැවතුම්පල විදුලි බිල ගෙවීම | 21 | 011832 | 37,968.00 |
| | ජිනසිරි සහෝදරයෝ - 2020 පෙබරවාරි මස කියවීම් ශාලාවට පුවත්පත් සැපයීම | 27 | 011837 | 14,230.00 |
| | බී.කේ.ඩී.පී.ජිනදාස - 2020 පෙබරවාරි මස මහජන පුස්තකාලයට පුවත්පත් සඟරා සැපයීම | 28 | 011838 | 12,900.00 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ - දායක මුදල් ගෙවීම 2019 දෙසැම්බර් | 30 | 011840 | 14,109.01 |
| 2020.04.23 | සභාපති බුලත්ගම එක්සත් මිතුරු සංසඳය - බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ගලි ප්‍රතිකාරක පද්ධතිය පුළුල් කර නව පෙරණයක් ඉදි කිරීම | 37 | 011847 | 348,299.48 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය - 2020-02-03 සිට 2020-3-27 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 38 | 011848 | 73,075.35 |
| | 2020-03-06 සිට 2020-03-12 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 38-1 | 011848 | 37,841.00 |
| | 2020-03-08 සිට 2020-03-17 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 38-2 | 011848 | 36,026.00 |
| | 2020-02-08 සිට 2020-03-06 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 39 | 011848 | 66,494.00 |
| | බී.කේ.ටී.එස්.අමරදාස (බී.කේ.ජී.පෙට්‍රෝලියම්)- 2020-02-27 සිට 2020-03-06 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 40 | 011850 | 80,926.96 |
| | 2020.03.08 සිට 2020.03.31 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 40-01 | 011850 | 68,242.32 |
| 2020.04.24 | ඩී සැම්සන්ස් ඇන්ඩ් සන්ස් - සෞඛ්‍ය අංශයට බූට්ස් ගැනීම | 41 | 011851 | 12,995.00 |
| 2020.04.26 | පරන්තන් කෙමිකල්ස් කම්පැණි ලිමිටඩ් - සෝඩියම් හයිපප්‍රෝලයිඩ් මිළදී ගැනීම නගර විෂබීජහරණයට | 42 | 011852 | 31,295.00 |
| 2020.04.29 | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 මාර්තු මස බස්නැවතුම්පල විදුලි බිල ගෙවීම | 44 | 011854 | 37,997.40 |
| 2020.05.04 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 මාර්තු මස බස්නැවතුම්පල ජල බිල ගෙවීම | 02 | 011857 | 71,255.95 |
| | Dialog Broadband Networks (PVT)Ltd – කාර්යාලයේ අන්තර්ජාල බිල ගෙවීම | 06 | 011859 | 11,340.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.11 සේවා ගිවිසුම් අලුත් කිරීම හා නැවත සේවයට බඳවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

➢ යූ.ආර්.ලාල් ගුණරත්න මයා

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.12 රට තුළ පවතින කොවිඞ් 19 වසංගතය තත්ත්වය හේතුවෙන් වරිපනම් බදු, කඩ කුලී, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු සහ දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සම්බන්ධව පහත සඳහන් පරිදි ඉටු කිරීමට සභා තීරණයක් ලබා ගැනීම.

- මාර්තු මාසය සඳහා කඩ කුලිය -50% කින් අඩු කිරීමට
- අප්‍රේල් මාසය සඳහා කඩ කුලිය -75% කින් අඩු කිරීමට හෝ අය නොකර සිටීමට
- මාර්තු, අප්‍රේල් මාසවල වරිපනම් ප්‍රමාද ගාස්තු අය නොකර සිටීමට
- ව්‍යාපාර බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු අය කර ගැනීමේ කාල සීමාව දීර්ඝ කර ගැනීමට
  (මාර්තු 31 වන දිනයට පෙර අය කර ගත යුතුව ඇත)
- ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තුවලට අදාළ ප්‍රමාද ගාස්තු අය නොකිරීමට
- සියළුම දඩ මුදල් අය නොකිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා මාර්තු මස 19 වන දින සිට 2020 මැයි 11 දින දක්වා මෙම ගැටලුව පැවති බැවික් මාර්තු සම කුළියෙන් 50%ක මුදලක් ද අප්‍රේල් මස කුළිය අය නොකර සිටීම සුදුසු බව පවසන ලදී.
මෙහිදී අදහස් දක්නව ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුස්ප කුමාර මැතිතුමා ඇඳිරි නීති සමයේදී සිල්ලර කඩ හා ෆාමසි විවෘතව තැබූ බැවින් සභාව සතු එවැනි ව්‍යාපාර සිදු කරන කඩ කාමර තිබේදැයි විමසන ලදී.
මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා මහජන පොළ කඩ කාමර කිහිපයක් පමණක් තිබෙන අතර ෆාමසි කිසිවක් නොමැති බව පවසන ලදී.
බස්නැවතුම්පල කඩ කාමර පොය දිනවනලදී වසා තබන ලෙස කොතරම් පැවසුවද ඔවුන් කඩ කාමර වසා නොතබන බැවින් ඔවුන් සඳහා සහනයක් ලබා දෙන බවට

සඳහන් කර යවන ලිපියෙහි නගර සභා නීති රීති සහා ගරු කරන ලෙසද දටහන් කර යවන ලෙස පවසන ලදී.

හෙදීදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පපත්ති මතිතුමා ව්‍යාපිකයන් ගේ සේවකයින් දුර බැහැර බැවින් ඔවුන් ගෙන්වා ගැනීමට අපහසු වූ බවත් අබ්‍රෙල් මස අවුරුදු සමය සඳහා ව්‍යාපාරිකයින් භාණ්ඩ තොග රැස් කර ගත් අතර ඒ සඳහාද ව්‍යාපාරිකයින් ණය වී ඇති බැවින් ඔවුන් සඳහා දිය හැකි උපරිම සහනය ලබා දෙන ලෙස වෙළෙඳ සංගමයේ සභාපති ලෙෂ තමන් ඉල්ලා සිටින බව පවසන ලදී.

රවීන්ද්‍ර මැතිතුමා අදහස් දක්වමින් මැයි මාසය සඳහා වුවද ව්‍යාපාරිකයින් සඳහා කොළඹින් බඩු භාණ්ඩ ගෙන්විය නොහැකි බැවින් මැයි සම සඳහා සහනයක් ලබා නෙ ලෙෂ පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තමන් සඳහා සහනයක් ලබා දෙන ලෙස ව්‍යාපරිරිකයින්ගෙන් ඉල්ලීමක් ලබා ගන්නා ලෙස පවසන ලදී.

ගරු සභාලපතිතුමාමේ පිළිබඳව අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපි දිරිපත් කළ යුතු බවයි

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා ආණ්ඩුකාර තුමා වෙත ලිපි යැවීමේදී ක හිමියන් මුහුණ දී ඇති සැබෑ තත්ත්වය සඳහන් කර ලිපිය යවන ලෙයසි. වෙළෙද ව්‍යාපාරිකයින් වැටුනු විට නගර සභවේ සියලු දේ වැයෙන බැවින් වෙළෙඳ ව්‍යාපාරිකයින් ආරක්ෂා කිරීම සඳහා මුල් තැන ලබා දිය යුතු බව පවසන ලදී.

මැණික් කඩ පොදු වෙළෙඳසැල කඩ කාමර බස්නැවතුම්පල කඩ කාමර

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.13 ආපදා ණය ලබා ගැනීම - සංවර්ධන නිළධාරි සී.කේ.දෙනිපිටිය මිය - රු.250,000.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.14 බේල් මැෂින් එකක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට මෙන්ම ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවට ගැටලුවක් වී ඇති කුණු කසළ පිළිබඳ හොඳම විසඳුම වන්නේ බළන්ගොඩ නගර සභාවට අයත්

බැංකියවත්ත කුණු කසළ අංගනය පුලුල් කර බළන්ගොඩ කලාපයේම කුනු කසළ එකතු කළ හැකි මධ්‍යස්ථානයක් බවට පත් කිරීම බව පවසන ලදී. එමෙන්ම ඒ සඳහා කුණු කසළ පිළිස්සුම් උපකරණය ගෙනවිත් සවිකළ යුතු බව පවසන ලදී.....

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.15 බළන්ගොඩ බස්නැවතුම්පලේ සී-39 කඩයට යාබද හිස් කවුළුවේ පොලිස් මුරපොළ හා නගර සභාවේ බස්නැවතුම්පල මුරකුටිය ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
රු.200000.00

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.16 පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගයන්හි කුනු කසළ එකතු කිරීම සඳහා Bolero Truck රථයක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ACLG 04 /08 හා 2020-01-28 දිනැතිව යොමු කරන ලද "රාජ්‍ය ආයතන සඳහා මෝටර් වාහන ප්‍රසම්පාදනය" යන ලිපිය හා මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 7/2019 ප්‍රකාරව Bolero Truck රථය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට ලිපි ඉදිරිපත් කර ඇතත් මේවන තෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බැවින් එම අනුමැතිය ලැබෙන තෙක් එම රථය මිළදී ගැනීම සඳහා 2020-04-06 දින සභාවේ අනුමැතිය ලබා ගත් බව පවසන ලදී.

එනමුත් මෙම වාහනය මිළදී ගනු ලබන්නේ සභා අරමුදලින් වන බැවින් එසේ මිළදී ගැනීමේදී පළාත් පාලන ආමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය නොවන බවත්, එසේ අනුමැතිය ලබා ගත යුත්තේ මධ්‍යම ආරක්ෂා හා පළාත් සභා අරමුදල යොදවා වාහන ලබා ගැනීමේදී බැවින් මෙම රථය මිළදී ගැනීම සඳහා එසේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06. මන්ත්‍රී යෝජනා

**06.01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

06.01.01 වෙළෙඳපොළ භාරකරුවෙක් සිටින බැවින් ඉරිදා පොළේ ඇති සම්මත අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කරන්න.

06.01.02 ඉරිදා පොළ ඇති වැසිකිළිය ඉක්මනින් නවීකරණය කිරීම.

06.01.03 ඉරිදා පොළට අයත් කැන්ටිම පාරිභෝගිකයන්ට සහ වෙළෙන්ඳන්ට පාවිච්චියට සලසා දීම.

06.01.04 තොග පොළ සහ තොග පොළ තුළ සිටින කපුටන් සහ පරවියන් විසින් අපවිත්‍රකර ඇති ගොඩනැගිල්ල ශුද්ධ පවිත්‍ර කර දීම.

06.01.05 ඉරිදා පොළ පවත්නා දිනයන් හා අනෙකුත් දිනවල සාදා ඇති කඩවල පමණක් වෙළෙඳාම් කිරීම.

06.01.06 දිනපතා ව්‍යාපාර කරන කඩ කාමර විවෘත කර තැබීමට සුදුසු පියවරක් ගන්න.

06.01.07 කිරිඳිගල පාර දෙපස එළවළු, පළතුරු, සහ වෙනත් දේවල් විකිණීම නවතා ඇල්ලෙඅරාව හන්දිය දෙසට ගෙන යාම.

06.01.08 සෞඛ්‍යයට අහිතකර අන්දමින් සෑම තැනකම බිත්තර විකිණීම ගැන සොයා බැලීම.

06.01.09 ගොරොක්ගහමඩ - මිරිස්වත්ත පාර දෙපස දමා ඇති එළවළු බ්‍රහස්පතින්දා කිරිමැටිතැන්න පොළට ගෙන යාම.

06.01.10 මාළු වෙළෙඳාමෙන් පසු කඩවල ඉතිරිවන අපද්‍රව්‍ය ඉවත් කර කඩ සහ එම ස්ථාන පිරිසිදු කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තමා දීර්ඝ කාලයක සිට වෙළෙඳම් සිදුකළ අතර නැවත වරක් වෙළෙඳම් කටයුතු සඳහා නිරත වන බවද තම සභාපති වශයෙන් සිටි සමයේදී කාර්ය සාධන තරගයේදීදී මහජන පොළ හතර වතාවක් සබරගමුව පළාත්ේ ප්‍රථම ස්ථානය වූ අතර අද වන විට එම ස්ථානය ජරාජීර්ණ තත්ත්වයකට පත්වී ඇති බව පවසන ලදී. කපුටෝ මහජන පොළෙහි ජරාකර ඇති අතර බිත්ති තීන්ත ආලේප කිරීමක්ද සිදුකර නොමතැ බවත් පොසුවෙළෙඳසැල් භාරකරු තම රාජකාරිය නිසියාකාරව සිදු නොකරන බැවින් ඔහු එයින් ඉවත් කර වෙනත් අයෙකු යොදවන ලෙසද මහජන පොළ සඳහා මුරකරුවෙකු යොදවන ලෙසද පවසන ලදී. ගවයින් පොළට පැමිණ වෙළෙන්ඳන්ගේ එළවලු ආදිය ආහාරයට ගන්නා බවද එමෙන්ම මහජන පොළ වැසිකිළිය අබලන් වී ඇති බැවින් එය පිළිසකර කර දෙන ලෙසද පොළෙහි පොළ කුටි තුළ හැරුණු විට වෙනත් ස්ථාන වළ බඩු දැමීමට අවස්ථාව ලබා නොදෙන

ලෙසද මහජන පොළ පිළිබඳව මීට වඩා උනන්දුවෙන් කටයුතු කරන ලෙසද පවසන ලදී.1.20

බළන්ගොඩ නගරය කොවිඩ් 19 පාලනය කිරීම සම්බන්ධයෙන් වෙනත් නගර වලට වඩා හොඳ මට්ටමක පවතින අතරබළන්ගොඩඩ නගරයේ වෙළෙන්ඳන් මේ වන විට අසරණ තත්තවයකට පත්ව ඇති අතර සභාපතිතුමා පිටස්තර වෙළෙන්ඳන් ඉවත් කිරීම සම්ලන්ධයෙන් ගත් තීරණය හොඳ නමුත් එළවලු සඳහා භූමිතෙල් දැමීම වැරදි බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.02 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

06.02.01 දැනට පවතින තත්ත්වය මත සභාවට දෛනිකව එන පුද්ගලයින්ගේ උෂ්ණත්වය මැනීම සඳහා උෂ්ණත්වමානයක් මිළදී ගැනීම හා එය සෞඛ්‍ය අංශය වෙත ලබා දීම යෝජනා කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා මෙම උෂ්ණත්ව මානය තුළින් සභාව වෙත පැමිණෙන මහජනතාව මෙන්ම සභාවේ කාරය මණ්ඩලයද පරීක්ෂාවකට ලක් කළ හැකි අතර එමඟින් ගැටලුවක් ඇති පුද්ගලයින් සිටීනම් අඅන් අයගෙන් ඉවත් කර තැබිය හැකි අතර මේ සඳහා විශාල වියදමක්ද නොයන බව පවසන ලදී.

එමෙන්ම බේල් මැෂින් එක මිළදී ගැනීමට පෙර එහි තත්ත්වය දැනගැනීම වගකීම අලෙවියෙන් පසු සේවාව ආදදිය පිළිබඳ දැනුවත් වීම සඳහා අදාළ මිළදී ගන්නා ආයතනයේ නියෝජිතයෙකු කැඳවා සභාව දැනුවත් කරන ලෙස පවසා සිටන ලදී.

එමෙන්ම මහජන පොළ තුළ මාළු වෙළෙදාම කිරීමට ලබා දීම පිළිබඳ එවකට පැවති සභාවේදී තමන් විරුද්ධ වූ අතර අද එවක සිටි ගරු සභාපතිතුමාම එය වැරදි බව පිළිගන්නා බව පවසන ලදී.

**06.03 ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා**

06.03.01 දැනට රටේ පවතින කොවිඩ් 19 රෝගය නිසා රටේ පවතින ඇඳිරි නීති තත්ත්වය නිසාත් නගර සභාවේ ඉල්ලීම පරිදි කඩ කාමර වසා තැබීම නිසාත් මාර්තු මස 19 වනදා සිට බළන්ගොඩ නගර සභාවට අයත් කඩ සාප්පු වල කඩ කුළිය අය නොකිරීම සම්බන්ධව සභා තීරණයක් ලබා ගැනීම.

කොවිඩ් 19 අරමුදල වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ දායකත්වය ලබා දීම පිළිබඳ ගරු මන්ත්‍රීවරීන්ගේ කැමැත්ත විමසන ලදී. එහිදී ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා තම මැයි මස මාසික දීමනාවද ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා රු.5000.00 මුදලක්ද පරිත්‍යාග කරන බවද ගරු නාගරකි මමන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා කිසිදු මුදලක් පරිත්‍යාග නොකරන බවද ඉතිරි සෙසු මන්ත්‍රීවරුන් සියලු දෙනා රු.1000.00 ක මුදලක් පරිත්‍යාග කරන බවද පවසන ලදී.

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**08. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා

සභාව විසින් නගරයේ කටයුතු ක්‍රමවත්ව නීත්‍යානුකූලව සිදු කරමින් සිටින විට සභාවේ තත්ත්වය නීත්‍යානුකූල තත්ත්වයට ගත යුතු අතර නගරයේ හදවන බඳු වෙළෙන්ඳන් ආරක්ෂා කර ගත යුතු බව පවසන ලදී. එමෙන්ම නගරයේ විවිධ ස්ථාන වල මේවන විට වෙළෙඳම් කටයුතු සිදු කරන බැවින් එම ව්‍යාපාර කටයුතු නැවැත්විය යුතු බවද

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරකි මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ලංකාවේ සෑම තැනකම මෙය දක්නට ලැබී ඇති අතර මහජනතාව එක සථානයකට එක් රැස් වීම වළක්වා ලීම සඳහා මෙම පියවර රැගෙන ඇති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා

ඉමහිදී අදහස් දක්වන ලද ගරුනාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා තමන් සභාව සඳහා සහභාගි වූයේ දිගු කාලයකින් පසුව බවද තමන් මහ මැතිවරණය සඳහා නාම යෝජනා ලබා දුන් බැවින් සභාවට නොපැමිණි අතර සමකාර කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි අදදින සභාව සඳහා පැමිනි බවද පවසන ලදී.

නගර සභාව සාවක් ලෙෂ ගත් කළ බතා හොඳ භාවක් බවද විශේෂ අවස්ථාවන්හිදී සියලු දෙනා එක්වී නගරය ආරක්ෂා කිරීම සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කළ අතර ඒ සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රී වරුන් සඳහාද ස්තුතිය පුද කරන ලදී.රත්නපුර දිස්ත්‍රික්කයේ

ප්‍රධානම නගරය රත්නපුර වුවද බළන්ගොඩ යනු දිස්ත්‍රික්ක දෙකක් අවසන් වන නගැරයක් වන බැවින් සෑම දෙසන්ම වෙළෙනඳන් පැමිණෙන නගරයක් බව පවසන ලදී.එබැවින් මෙම නගරය ආරක්ෂ කිරීම බෙහෙවින් අපහසු වුවද නගර සභා කණ්ඩායම විසින් ගනු ලැබූ තීන්දු තීරණ සාර්ථක වූ බවද ඒ පිළිබඳ සියලු දෙනා ෂතුටු වියු තු බවද පවසන ලදී. ....

මෙම වසංගත තත්ත්වයෙන් අනතුරුව මීළඟ ගැටලුව වන්නේ ඩෙංගු පිළිබඳ ගැටලුව බව පවසන ලදී.

එමෙන්ම පිටස්තර වෙළෙන්ඳන් නැවැත්වීම හොඳ ක්‍රියාවක් වන නමුත් ..ඉටු කිරීම වැරදි වන අතර එය මහජන සෞඛ්‍ය පරීක්ෂබ වරු හරහා හෝ පොලිසිය හරහා එම වෙළෙන්ඳන් ඉවත් කිරීමට හැකිව තිබූ බව පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගරය යනු අභිමානවත් නගරයක් වන අතර එය අපකීර්තියට පත් නොකළ යුතු බවද බළන්ගොඩ ආනන්ද මෛත්‍රි නා හිමියන් උපන් බිම මෙන්ම ලෝකයේ ප්‍රථම අග්‍රමාත්‍යවරිලගේ උපන් බිම වන බළන්ගොඩ ජනතාවවයට ආඩම්බරයක් වන ලෙෂ කටයුතු කළ යුතු අතර මෙම ක්‍රියාව මඟින් ගරු සභාපතිතුමාට පෞගලිකව මෙන්ම බළන්ගොඩ නගරයට විශාල මඩ ප්‍රහාරයක් එල්ල වූ බව පවසන ලදී.

එබැවින් මහජන නියෝජිතයනි වශයෙන් විශාල වගනකීමකින් කටයුතු බල යුතු අතර අන් අයට පූර්වාදර්ශයක් වන ලෙෂ කටයුතු කළ යුතු බව පවසන ලදී.ඉදිරියේදී අවශය කටයුතු සඳහා පූර්ව සහයෝගය ලබා දෙන අතර හොඳ ද් සඳහා අත ඔසවන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

උකිළ එල්ලාවලමැතිතුමා පැවසූ ආකාරයට පිටස්තර ජනතාව එළවලු වෙළෙඳාම් සිදු කිරීම නිසා බළන්ගොඩ වෙළෙන්ඳන් සඳහා ආදායමක් ලබා ගැනීමට නොහැකි වූ අතර

ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා ප.ව.12.45 ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.

ගරු නාගැරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා

සභාව මෙම ස්ථානයේ පවත්වාගෙන යාමෙන් කිසිඳු ගැම්මක් නොමැති අතර සභාව සභා ගර්භයේදීම පැවැත්වීම සඳහා අවශ්‍ය හැකිකම් අවශ්‍ය කටයුතු සලසන ලෙස පවසන ලදී. එමෙන්ම නගරයේ සෑම ස්ථානයකම රළවලු දමන අතර කොරෝනා වසංගතය අවසන්ද නැද්ද යන්න තවම පැවසිය නොහැකි බවද ,,... සභාවේ නිළධාරීන් කැපවීමෙන් කටයුතු ළ අතර එයට ස්තුතිය පුද කරන බවද මෙම වසංගතය හේතුවෙන් සභාවට ලැබිය යුතු

ආදායම ලක්ෂ 100 කට වවඩා වැඩි මුදලක් අහිමිව ඇති අතර එබැවින් මන්ත්‍රී ප්‍රතිපාදන ලෙෂ ලබා දෙන රු.800000.00 ක මුදල ලබා දි හැකිද යන්න විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ප.ව.2.50 ට පමණ සභාවෙන් පිටව යන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා

බළන්ගොඩ ආදර්ශමත් නගරයක් වන අතර එහි ගෞරවය ගරු සභාපතිතුමාට යා යුතු බව පවසන ලදී. ගරු සභාපතිතුමා විශාල වැඩසටහනක් සිදු කළ අතර හොඳ වැඩ පිළිබවෙලක් කරගෙන ගිය බැවින් ගරු සභාපතිතුමාට ස්තුතිය පළ කරන බව පවසන ලදී.

**09. අවසානය**

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ කොවිඩ් 19 වයාප්තිය පාලනය කිරීම සම්බන්ධයෙන් මධ්‍යම රජය තීන්දු තීරණ ගැනීමට පෙර අප සභාවට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට හැකි වූ බව පවසන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.